# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.08.07 පැය 1505 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 1545/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මහනුවර ඓතිහාසික ඇසළ පෙරහර - ශ්‍රී ලංකා පොලිසියේ ආරක්ෂක වැඩපිළිවෙල සහ රථවාහන සැලැස්ම.**

ශ්‍රී දළදා මාලිගය විසින් වාර්ෂිකව පවත්වනු ලබන මහනුවර ඓතිහාසික ඇසළ පෙරහර මංගල්‍ය 2025.07.30 වන දින ආරම්භ කර 2025.08.08 වන දින දක්වා වීථි සංචාරය කරනු ලබයි.

ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා පොලිසිය විසින් විශේෂ ආරක්ෂක වැඩපිළිවෙලක් සහ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලබන අතර, ඒ සඳහා මාර්ග බාධක, ආරක්ෂක රාජකාරි, රථ වාහන හා පුද්ගලයින් පරීක්ෂා කිරීම, සංචාරයිකයින්ට මග පෙන්වීම හා රථ වාහන ගාල් කිරීම් ඇතුළු විශේෂ වැඩපිළිවෙලක් දියත් කර ඇත.

පෙරහර කාලසීමාවන් තුළ ක්‍රියාත්මක රථවාහන සැලැස්ම හා දෛනික රථවාහන සැලැස්ම පහත පරිදි වේ.

**අවසන් රන්දෝලි පෙරහර 2025.08.08 වන දින වීථි සංචාරය කරනු ලබයි.**

- කටුගස්තොට සිට මහනුවර නගරයට පැමිණෙන සියළුම වාහන මහයියාව හන්දියෙන් තිලක් රත්නායක මාවත ඔස්සේ පොලිසිය හන්දියෙන් මහනුවර නගරය වෙත ගමන් කළ හැක.
- කටුගස්තොට දෙසින් පැමිණෙන සැහැල්ලු වාහන පමණක් මහයියාව, ඩී.එස්. සේනානායක වීදිය ඔස්සේ පැමිණ ඒ.ඒ.ධර්මසේන මාවතෙන් හරවා තිලක් රත්නායක මාවත ඔස්සේ ගමන් කළ හැක.
- කටුගස්තොට දෙසට පිටවන වාහන මහනුවර පොලිසිය අසලින් තිලක් රත්නායක මාවත ඔස්සේ කටුගස්තොට දෙසට ගමන් කල හැකිය.
- තැන්නේකුඹුර හා අම්පිටිය දෙසින් පැමිණෙන වාහන සංඝරාජ මාවත ඔස්සේ වේල්ස් පාර්ක් හන්දියට පැමිණ ඇහැලේපොල කුමාරිහාමි මාවතෙන් දකුණට හැරී බෝගම්බර දුම්රිය පොල අසලින්ද කොළඹ දෙසට යාමට වම් පසටද, නගරයට යාමට දකුණු පසට යා හැකිය. එසේම

රජ පිහිල්ල මාවත හන්දියෙන් පල්ලිය පාර ඔස්සේ මහනුවර නගරයට ඇතුළු විය හැක.

- නගරයේ සිට අම්පිටිය, තෙල්දෙණිය මාර්ගයේ ගමන් කරන වාහන ඔරලෝසු කණුව වටරවුමෙන් ටොරින්ටන් හන්දිය, පල්ලිය පාර ඔස්සේ වේල්ස් පාර්ක් හන්දිය හරහා සංඝරාජ මාවත ඔස්සේ ගමන් කල යුතු අතර වාහන තදබදයක් ඇත්නම් බෝගම්බර වටරවුම, ඇහැලේපොළ කුමාරිහාමි මාවත, රජපිහිල්ල මාවත, සංඝරාජ මාවත ඔස්සේ අම්පිටිය හා තැන්නේකුඹුර දෙසට ගමන් කල හැක.

- රථ වාහන සැලැස්ම සඳහා පල්ලිය පාර දෙපසට රථ වාහන ගමන් කිරීමට හැකි වන පරිදි බෙදා වෙන් කර ඇත.

- මහනුවරට කොළඹ දෙසින් ඇතුළු වන හා නගරයෙන් කොළඹ දෙසට පිටවන වාහන සඳහා පරණ පේරාදෙණිය පාර හා විලියම් ගොපල්ලව මාවත භාවිතා කල හැක.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**